# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2126/15 - 2019 ජුනි මස 04 වැනි අඟහරුවාදා - 2019.06.04**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2019 අංක 337/2

ජනා.කා.අංකය : පීඑස්/සීඑස්ඒ/00/1/6/2.

අතිගරු ජනාධිපතිතුමා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාව යටතේ 2019 මැයි මස 29 වැනි දින සිට පහත සඳහන් අමාත්‍යවරුන් පත්කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

| නම | | ධුරය |
|---|---|---|
| 1. ගරු පැලිස්ගේ හැරිසන් මැතිතුමා, පා.ම. | - | කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය. |
| 2. ගරු රත්නායක මුදියන්සේලාගේ රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා, පා.ම. | - | රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍ය |

අතිගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි,

**උදය ආර්. සෙනෙවිරත්න,**
ජනාධිපති ලේකම්.

2019 මැයි මස 31 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

06 - 524/1

1A - G 30223 — 387 (2019/06)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2019 අංක 337/3

ජනා.කා.අංකය : පීඑස්/සීඑස්ඒ/00/1/6/2.

අතිගරු ජනාධිපතිතුමා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාව යටතේ 2019 මැයි මස 29 වැනි දින සිට ක්‍රියාත්මකවන පරිදි පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු වසන්ත නරේෂ් පරාක්‍රම සේනානායක මැතිතුමා, විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා වශයෙන් පත්කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අතිගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි,

**උදය ආර්. සෙනෙවිරත්න,**
ජනාධිපති ලේකම්.

2019 මැයි මස 31 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

06 - 524/2

---

# රජයේ නිවේදන

## නිවේදනය

ජනා.කා.අංකය : පීඑස්/සීඑස්ඒ/00/1/13/12.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46 (3) (ආ) ව්‍යවස්ථාව යටතේ, පහත සඳහන් අමාත්‍යවරුන් සිය අමාත්‍ය ධුරවලින් 2019 මැයි මස 29 වැනි දින සිට ඉල්ලා අස්වී ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

| නම | | ධුරය |
|---|---|---|
| 1. ගරු පැලිස්ගේ හැරිසන් මැතිතුමා, පා.ම. | - | කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය |
| 2. ගරු රත්නායක මුදියන්සේලාගේ රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා, පා.ම. | - | රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍ය |

අතිගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි,

**උදය ආර්. සෙනෙවිරත්න,**
ජනාධිපති ලේකම්.

2019 මැයි මස 31 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

06 - 524/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.